Page 6 June 2011.qxd 07/06/2011 14:59 Page 1



# නිර්මාණ Nirmana

## අනුබුදු රැස්

සිඳ බිඳ රැඳුණු මිසදිටු දොස අඳුර ගෙන
සද හම් කිරණ පෑ අනුබුදු මහිමි ගුණ
අද වුව මෙබිම බොදු අසිරිය නගනු මෙන
විද හයි පොසොන් සඳරැස් දස දෙසට පැන

සදහම් මිහිරි හඬ දෙසවන වෙත පැවා
බැතිබර පහන් සිතිවිලි හද මතු වූවා
පැතිරෙන පොසොන් සඳ දිය දහරින් නාවා
ඇතිරිලි එලයි දාගැබ බෝමැඩ ගාවා

♦ සමන් රුවන් ලේකම්ගේ
බලන්ගොඩ Sri Lanka

## පොසොන් සිසිල

සදහම් අමා බිඳු සිරිලක දසත විදා
සීතල සුනිල දියදහරක් විලස එදා
මිසදිටු අඳුරු තිමිරෙන් හෙළ දෙරණ මුදා
ලොව සුමිහිරිම පණිවුඩයයි දුන්නෙ බෙදා

දස අත දිලෙන පුන්සඳ කැන් සැර සිලිය
තුඩ තුඩ නැගෙන බැති ගී පද නැළ විලිය
සදහම් හැඟුම් පුබුදාලන සිතු විලිය
සිසිලස මේ විඳින ලොව්තුරු පිවි තුරුය

♦ චන්ද්‍රා රෝහිණී කැට්පෙආරච්චි
ඇල්පිටිය Sri Lanka

## A Tree That Stood In Havelock Road
### ( A poem rethought )

Down Havelock Road, Colombo six,
Where gardens bloomed in sun and rain,
When Mother ruled and home was life,
There was I on our Mango Tree,
My leafy fruited green haven,
Where kohas sang and mynahs chirped
While squirrels danced at hide-and-seek.
A psychic crow, the lone magpie
Hopping from greening twig to branch,
Would stalk and haunt me every climb
Determined to communicate.

The rustle of leaves, a crackle of twigs
Would reveal my perch, with quiet
Drops of spotted, yellow jackets
Bursting flesh clammy and clumsy,
To spread an odour raw and sweet
Rousing honey-bee, bird and fly.
And high above the lofty trunk,
Silver wings droning in the sun,
Would flash through shade of leaf and branch,
Drawing white woollies in slipstream.

As winds raged, rains lashed, to sober
Widely indulgent sunshine years,
To tear away the wraps of bark,
While leafless twigs and sapless limbs
Began to bow, wrench free and fall,
Mother decreed.
Naked, it crashed.
Soon, erstwhile neighbours rooted gazed
With bruised fronds to sough in grief.
A little orb of ghostly glow
Streaked up from wood, and hid in air,
Down Havelock Road
Colombo six.

♦ Wewage A. M. Dep
Letchworth - Herts - UK

## දයාබර ඔබ

ඔබ කවක් වෙන්න ඒ කව්පද මට මුමුණන් න
ඔබ දොළක් වෙන්න දොළමත හිඳ සිසිල විඳින් න
ඔබ මලක් වෙන්න තුරුළුකරන් මට සිප ගන් න
ඔබ මගේ වෙන්න සැමදා ඔබ ළඟින්ම ඉන් න

පුර හඳක් වෙලා මගෙ ලෝකය එළිය කරන් න
මදනලක් වෙලා මගෙ ගත සිත සනසා ලන් න
දිය බිඳක් වෙලා මගෙ පවස එයින් නිවන් න
ඔබ මගේ වෙන්න මට ඔබ ළඟ සුවය විඳින් න

පුර හඳක එළිය ඔය මුහුණෙන් මට දැක ගන් න
තරු දිලෙන රැයක එළිය ඔබේ නෙතින් දකින් න
ඒ ලොව්තුරු සුව විඳිනා බව මට සිහිවෙන් න
ඔබ මගේ වෙලා මා ළඟ සැමදා ඔබ ඉන් න

♦ අශෝක ප්‍රේමලාල් පතිරණ Sri Lanka



## මිස්සක පව්වේ සිට

හිමියනි මේ තරම් සෙනගක් සුදු පාට
ඇඳගෙන කියන්නේ ඔබෙ ගුණයද කාට
විසිතුරු විදුලි බුබුලින් එක එක පාට
මේ මුළු පළාතම එළියයි අද රෑට

තිස් සය නවතින්න තිස්සය නව තින්න
උස් හඬ ඇසේ තවමත් ළඟ ළඟ මෙන්න
ලස් සන පා සිවුරු පිරිකර මට දෙන්න
මිස් සක පව්ව මුදුනට නැවතත් එන්න

♦ බන්දුසේන වන්නිආරච්චි
ගාල්ල Sri Lanka

## නමදිම් පිය පා

අසුතුන් වසක දිගු ගමනක දිවි මගට
නැවතුම තබා සත් වසරකි මැයි මසට
තවමත් අප සමග බව දැනෙනව සිතට
මේ කව් කුසුම් මිට පියතුම ඔබෙ නමට

පුබුදනු පිණිස අත දී ගම් දරු නැණැස
පෙන්වා සුමග හා බොල් දිවියෙහි වෙනස
සැළසුව රැකවරණ නිති ගිපිදෙකු විලස
හිස් අය ඉදිරියේ නැත නැමුවේ සිරස

මැති ඇමතියන් පසුපස නැත ඔබ දිව්වේ
එකමුතු කරන් සැම ගම මං පෙත් තැනුවේ
තම විමි තුළද කැනවා පොදු ළිං පිදුවේ
ජන සෙත මිසක් නැත වෙන කිසිවක් පැතුවේ

යළි ඔබ උපත මනුසත් බවයෙම වේවා
සසර පුරා ඔබ අපෙ පියතුම වේවා
අලපත දිය ලෙසින් සැම බැමි දුරු වේවා
මෙත් මුණි සරණ ලැබ අජරාමර වේවා!

♦ අයිරින් පටබැඳිගේ
London NW2

## භක්තිය

අහිංසක මිනිසුන්ගෙ ශ්‍රමය සූරාකමින්
උපයනා කහවනුව බිඳක් ගෙන දන්දෙමින්
දොරගුළුද හිරකරන් අත්මුදුන් දී වැඳන්
යදින යැදුමන් නොවේ - භක්තිය

ඔබ සුදුසු නෑ කියා අනුන් සිත් මල් තලා
බැතිවතක් මවාගෙන සුදුවතක් දරාගෙන
ජනී ජන ඉදිරියේ වේදිකාවට අවුත්
ගයන බැති ගී නොවේ - භක්තිය

උඩු පිළේ අය අපී, යටි පිළේ අය අපී
අපි උගත් පිරිස වෙමු අපි සමත් පිරිස වෙමු
එකිනෙකා පිල් බෙදී බුදු කුටිය දෙපස හිඳ
මුමුණනා ගාථා කවි නොවේ - භක්තිය

බුදුන් ගිය මග යමින් එකමුතුව සම සිතින්
මෙත් කරුණා මුදිතාදි උපෙක්ඛා ගුණ දරා
මුණිඳු වෙනුවෙන් කරන ප්‍රතිපත්ති පූජාව
නිසා හද තුළ නැගෙන සොම්නසයි!

♦ ප්‍රදීපා වික්‍රමසිංහ London SW19

## පොසොන් මහිම

දුව දුව වහින මෝසම් සුළඟෙන් නිරිත
පොසොන් මහෙදි මල් වරුසා වෙයි පතිත
පොසොන් යන වදන දෙයි මල් යන අරුත
ඒකයි පොසොන් නම මේ මාසෙට උචිත

අහසින් වැටෙන මල් වැහි පරයන ලෙසට
වස්සා දහම් වැසි පින් බර සිරි ලකට
අරහත් මිහිඳු මාහිමි කළ සෙත රටට
ආසිරිවාදයකි අද වුව අප සැමට

සසඳන විටදි බුදු සමිඳුගෙ දම් දෙසුම
මහ මේඝයකි ආවරණය වූ ලොවම
සිරි ලක්දිවට අනුබුදු හිමි දෙසූ දහම
මල් වැස්සක්ය මහ මේඝය හා අසම

මල් වැස්සක් වුණත් වියැළුණු බිම වැටුණ
නව පණ ලැබුණි ඉන් සිරි ලක මුළු දෙරණ
අදහපු ලක් දනා මළ ගිය අය පරණ
නිවනට යොමු වුණා ලැබ තිසරණ සරණ

තෙරුවන් පිහිට වූවට පසු රුවන් බිමේ
එය විය දහම් දිවයින එහි අනගි කමේ
කිතු රැස් දිගත පැතිරී ලොව එදෙස නැමේ
එහි දම් සුවඳ අද වුව මුළු ලොවම හැමේ

පුබුදා පොසොන් මල් සදහම් සුවඳ දෙන
මතුකර සසර ගමනෙදි ගොනු කෙරුණු පින
සදහම් මගට යොමු කරමින් විනෙය ජන
අනුබුදු වීය සිරිලක මහ මිහිඳු තැන

♦ මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම
Harrow UK

## ගෙවුණු වෙසක්

පන්සල් පිරී ඉතිරී සුදුවතින් එන
සැදැහැති පිරිස එක්රොක් වී උදෑ සන
දසසිල් අටසිල් හි පිහිටා අසා බණ
දවසම වෙසක් ගෙව්වා පින් පුරා ගන

සැක සංකා බිය ද නැති කළ රටක් මැද
උත්සව පවත්වා සිතු පැතු ලෙසින් අද
තබාදු කොඩි ළෙල දිදී ගුවනේ පවන් වැද
මුළු රට එකම සැණකෙළියක් වෙමින් සොඳ

එව කව බොව කියන දන්සැල් හතර වටේ
සාගිනි නිවා කහබත් රස තබති කටේ
බැලූ බැලූ තැන අඳුර දුරු වී එළිය වැටේ
ඒ වගෙ වෙසක් උළෙලක් නම් නොවිණි රටේ

හැම මාවතක බොදු කොඩිවැල් ළෙළ දෙනවා
විදුලි බුබුළු වැල් තොරණද බබ ළනවා
වෙසක් කූඩු එක දිගටම සෙල වෙනවා
රෑ එළිවෙන තුරුම ජනයා ගැව සෙනවා

බැතිබර සෙනගක්ය බුදු දහම ගරු කළ
සුන්දර රැයකි එය මුළු ලක එළිය කළ
දන්සැල් හැම තැනය රස අහර පුද කළ
ගෙවුණා වෙසක් අමතක නොවන කිසි කල

♦ ප්‍රේමා එස් සුරවීර
නුගේගොඩ Sri Lanka

## ගැටවර විය අබියස සිටින පුතු

කාලය ඉබි ගමනින් ගෙවී ගොසින්
පොඩි පුතුත් දැන් ටික ටික ලොකුවෙලා
සිතුම් පැතුම් එක දෙක වෙනස්වෙලා
ගැටවර විය පාමුලට පොඩි පුතු ඇවිත්

මම දන්නේ නැතිලු මට තේරෙන්නේ නැතිලු
මගේ ඉංග්‍රීසි හොඳ මදිලු එහි වැරදිත් ඇතිලු
මම හැඩ නැතිලු කලඑළියත් මදිලු
මගේ පොඩි පුතුට මා
දැන් අවුට් ඔෆ් පැෂන්ලු

වරක් මිස දෙවරක් නැත කිසිවක් පවසන්නේ
වැරදි ඇසුවොත් විගහට තරහායන්නේ
අම්මා මොන ලෝකෙද ජීවත්වන්නේ
අම්මට දැන් ඉංග්‍රීසි තේරෙනවා මදිදි?

හැප්පිලි ගෙරවිල් රැවුම් වලිනුත්
ඉඳහිට මට පැසසුම් ලැබෙත්
ඊසර මෙන් වචනත් ඉඳහිට ඇසෙත්
නෙත් අග කඳුළු බිංදුත් නොරැඳුණා නොවේ
එනමුත් පුතේ නැත කිසි අඩුවක් මා සෙනෙහේ
තවම ඔබ මට මගේ පොඩි පුතුමයි පුතුනේ !

♦ ලුම්බිණී විතාන
Langley UK

## පාඨක ලේඛක ඔබට

කවියට කලාවට අත හිත දෙන ලෙසට
මේ කවි පිටුව වෙන්වෙයි පාඨක ඔබට
සිතුවිලි ගොතා රසකවි ලියමින් හැඩට
අප වෙත එවනු මැන කාටත් කිය වන්ට

## පොසොන් සිතුවිලි

මිහින්තලා ගිරි ශිඛරය
කසාවතින් දිලෙන වරුණ
සරා හිඳින බුදුවරු පෙළ
අමුණන මුතු බුදු පදවැළ
සහන් එළිය පැතිර ගලයි
පොසොන් මිහිර දඹුලුගලයි

උතුම් රුවන් පතළ පුරේ
මිහින්තලා පඩි නැගුණේ
ඒනැග යන මිහින්තලේ
නිවන්පුරය ළං ළං වේ
එදා මිහිඳු හිමි වැඩියේ
සුදු බුදු රැස් සඳ නැගුණේ
දෙසූ දහම් පතළ වුණේ
ඒ සුදු බුදු රැස් මහිමේ

සහ පරපුර දහම් සිසිල
කෙත වැව දාගැබ පන්සල
ගමම දහම් සුවඳ කරන
දන මන ගුණ පස වඩවන
අරුමැසි පෙම්රස මතුවෙයි
ඉසුරුමුණියෙ පැතලි ගලක
දෑ හැඟුමන් පියුම් පිපෙයි
පැරකුම් පිළිරුව අබියස

අඩසඳ සඳකඩ පහණයි
තුරුලිය ලියවැල් ගානයි
දනමන සිත ගත සාරයි
විදුනැණ නෙතගුණ පාරයි
එවන් රුවන් රැක ගතහොත්
අපේ නමත් මතු රැක දෙය
මීමුත්තන් තම පණ මෙන්
රජ දවසෙත් රැකගත් දැය !

♦ මාලපල්ලේ
කුමුදු රොහාන් අමරසිංහ
Edmonton, London

## හැකිවෙද?

ඉඩෝරයෙන් ඉරි තැලූ සිත්යායක
අසනි වැස්සක් විය නුඹේ ප්‍රේමය
සත් වසරක ප්‍රේමයේ ශේෂවී තිබූ
නටඹුන් ද ගසාගෙන ගොස්
යළි මල් විකසිත වී ඇත.....

නුඹේ සෞම්‍ය වදන්වලින්
පියෙකු වැනි දයාබර බවෙන්
පෙම්වතෙකුගේ ආදරණීය බවෙන්
දිනෙන් දින පෝෂණය වන ආදරය
මගේ දිවියට යළි වසන්තය
රැගෙන ආ නුඹේ ප්‍රේමය
රැකගන්නම් දිවිය පුරාවටම....
හැකිද නුඹටත් රැකගන්න
මේ උතුම් ප්‍රේමය
එලෙසම.... ?

♦ ෂ්‍යාමලී කරුණාරත්න
Harrow on the Hill
London UK

## දෙනෙත

යටගියාවේ ගෙවුණු දවසක
අතරමං කළ දෑස මතකද ?
සදා නොවෙනස් දෙනෙත් මෙන් අපි
එකට සිටිමුයි කිව්ව මතකද ?
ඒ ගෙවුණු දින සිටියෙ මා මයි
ඒත් අද ඔබ නෑ මගේ ළඟ
එක නෙතක කඳුලැලි වැටෙන විට
අනිත් නෙත සැනසුණේ කෙලෙසද ?

♦ නිරෝෂා දමයන්ති
Sri Lanka

## අහිමි පෙම

සිනා මල් මැද - සසල කළ නෙත
තවත් සොඳුරුයි - දුටුව ඔබෙ වත
රැඳුණු මුත් ඒ - මසිත ඔබ ළඟ
රැගෙන ගොස් මා - නින්ද දුරකට

හැඟුණු මුත් පෙර - ඔබ මගේ බව
හිමිව ඇත ඔබ - වෙනත් හදකට
ගෙවී කාලය - අපට නොදැනිම
මොහොත ළං වෙයි - දුරස් වන්නට

ඔබ ගියත් අද - මාව තනිකර
අහිමි නිඳි නෙත - දෙන්න මා හට
මගේ දුක ඔබ විඳින දාකට
ඔබට බැඳි මා - නැගේ මතකෙට

♦ කේ. තිලාන් තරිඳු
Sri Lanka